## 2025 දෙසැම්බර් මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන සහ සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි.

**නිෂ්පාදන කටයුතුවල අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරමින්, නිෂ්පාදන අංශයේ ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2025 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 60.9ක අගයක් වාර්තා කළේය.** මාසය ආරම්භයේ දී අහිතකර කාලගුණික තත්ත්වයන්ගෙන් බාධා ඇති වුවද, ප්‍රධාන වශයෙන් උත්සව සමයේ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් සියලුම උප දර්ශක මෙම වර්ධනයට ධනාත්මකව දායක විය.

මූලික වශයෙන් ආහාර සහ පාන වර්ග නිෂ්පාදන අංශයේ වර්ධනය හේතුවෙන් දෙසැම්බර් මාසයේදී නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශක ඉහළ ගියේය. එමෙන්ම, මෙම මාසය තුළ දී නව ඇණවුම් සහ නිෂ්පාදනයන්ගේ දක්නට ලැබුණු වර්ධනයට අනුව සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනීම් උප දර්ශක ද ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් අමුද්‍රව්‍ය සඳහා ඇති ඉල්ලුම ඉහළ යෑම සහ අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ඇතිවූ සැපයුම් ප්‍රමාදයන් පිළිබිඹු කරමින් දෙසැම්බර් මාසයේ දී ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය තවදුරටත් දීර්ඝ විය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | නොවැ. | දෙසැ. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **55.5** | **60.9** | **+** | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නව ඇණවුම් | 58.5 | 63.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 50.0 | 61.2 | + | කඩඉම් මට්ටමේ සිට ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 55.5 | 58.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 57.0 | 53.7 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 57.7 | 62.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


වඩා යහපත් ආර්ථික තත්ත්වයන් පිළිබඳ බලාපොරොත්තු හේතුවෙන්, ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂා ධනාත්මකව පවතී.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**60.9**

2025 දෙසැම්බර්

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා**
**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට / කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| යුරෝපා කලාපය | වැඩි වේගයකින් පහත වැටීමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 ජනවාරි 16 වන දිනට (PMI Releases (spglobal.com))*

[1] *එස් &පී ග්ලෝබල්* (S&P Global) *ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, පෙර මාසයට සාපේක්ෂව සේවා ක්‍රියාකාරකම්වල කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරමින්, 2025 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 67.9ක අගයක් වාර්තා කළේය.**

2025 දෙසැම්බර් මාසය ආරම්භයේ දී අත්විඳින ලද අයහපත් කාලගුණික බාධාවන් මධ්‍යයේ වුවද, බොහෝ අංශවල ශක්තිමත් ක්‍රියාකාරිත්වය හේතුවෙන් දෙසැම්බර් මාසයේ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල සැලකිය යුතු වර්ධනයක් සිදු විය. උත්සව සමයේ ඉල්ලුම හේතුවෙන් තොග සහ සිල්ලර වෙළඳාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක විය. එසේම, වෙනත් පෞද්ගලික සේවා ක්‍රියාකාරකම් සම්බන්ධ ව්‍යාපාරික ක්‍රියාකාරකම් සහ නවාතැන් හා ආහාර පාන සේවා ක්‍රියාකාරකම්වලින් ලැබුණු හිතකර දායකත්වය ද මෙම ඉහළ යාමේ ප්‍රවණතාවයට සහාය දැක්වීය.

තොග සහ සිල්ලර වෙළඳාමේ ක්‍රියාකාරිත්වය වර්ධනය සහ ශක්තිමත් මුල්‍ය සේවා ක්‍රියාකාරකම් හේතුවෙන් 2025 දෙසැම්බර් මාසයේදී නව ව්‍යාපාරවල ඉහළ යෑමක් දක්නට ලැබුණි.

වසර අවසාන මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීම සඳහා ආයතන විසින් කාර්ය මණ්ඩල පුළුල් කිරීම හේතුවෙන්, 2025 දෙසැම්බර් මාසයේ දී සේවා නියුක්තිය තවදුරටත් ඉහළ ගියේය. මේ අතර, නිම කිරීමට නියමිත කාර්යයන් අඛණ්ඩව දෙවන මාසයටත් වර්ධනය විය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | නොවැ. | දෙසැ. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)** | **50.5** | **67.9** | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| **නව ව්‍යාපාර** | 53.6 | 64.6 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| **සේවා නියුක්තිය** | 55.7 | 52.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **නිම කිරීමට නියමිත කාර්යයන්** | 51.1 | 53.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| **අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම්** | 63.3 | 75.3 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


හිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් සහ සංචාරක කර්මාන්තය ආශ්‍රිත සෘතුමය සාධක මෙන්ම මෑත කාලීන කාලගුණික බාධාවන්ගෙන් පසුව මෙහෙයුම් කටයුතු ක්‍රමයෙන් සාමාන්‍යකරණය වීම හේතුවෙන් ඉදිරි කාර්තුව තුළ ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා වූ අපේක්ෂාවන් වඩාත් ධනාත්මකව ඉහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**

**67.9**

**2025 දෙසැම්බර්**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| **ගෝලීය** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **ඉන්දියාව** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **චීනය** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **එක්සත් ජනපදය** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **එක්සත් රාජධානිය** | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| **යුරෝපා කලාපය** | අඩු වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 ජනවාරි 16 වන දිනට*

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

ප්‍රශ්නාවලිය ඊළඟ මාසයේ පළමු භාගයේ දී සම්පූර්ණ කෙරේ. සෑම විචල්‍යයක් සඳහාම, පෙර මාසය හා සසඳන විට වැඩි වීමක්, අඩුවීමක් හෝ නොවෙනස්ව පැවතීමක් ද යන්න වාර්තා කිරීමට ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින අතර, යම් වෙනසක් සඳහා හේතු දැක්වීමට ඉල්ලා සිටිනු ලැබේ. දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස සැලකෙන අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම් සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශකයන්ගේ හරිත සාමාන්‍යයකි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සේවා ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිම කිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.